# කර්මාන්ත අමාත්‍යාංශය

## ලෝක ඇසුරුම් සංවිධානයේ අනුමත
## ඇසුරුම් තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පුහුණු පාඨමාලාව -2022

කර්මාන්ත අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය (SriLanka Institute of Packaging ) සමඟින් එක්ව ඇසුරුම් කර්මාන්තයේ නියුක්ත සේවකයින්ගේ කුසලතා සහ තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙහෙයවනු ලබන සති අන්ත පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඇසුරුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පහත සඳහන් සුදුසුකම් සහිත තාක්ෂණික මට්ටමේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස සමාගම් වලට ආරාධනා කරනු ලැබේ.

**සුදුසුකම් :**
අ. පො. ස (උ.පෙ.) සමත්වීම හෝ විද්‍යාව, කෘෂිකර්මය සහ ගණිතය යන විෂයන්ගෙන් එකක් ඇතුළුව සම්මාන 03 ක් සහිතව
අ. පො. ස (සා.පෙ.) සමත්, ඇසුරුම් ක්ෂේත්‍රය රැකියාව ලෙස තෝරා ගැනීමට කැමති අයට අයදුම්කල හැකි වන අතර දැනට ඇසුරුම් ක්ෂේත්‍රයේ නියැලී සිටින නිලධාරීන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දේ ( වසර 02 අවම සේවා පලපුරුද්ද ).

**මාධ්‍යය:** ඉංග්‍රීසි සහ සිංහල

**පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය :**

ඇසුරුම් ක්ෂේත්‍රයේ පරමාර්ථ/ඇසුරුම්කරණය හා ඵලදායිතාවය/තතත්ව කළමනාකරණය සහිත ඇසුරුම්කරණය/ පොලිමර් තාක්ෂණය/ඇසුරුම් පරීක්ෂාව/ඇසුරුම් භාවිතය/ඇසුරුම්කරණ ක්‍රියාවලිය/ආර්ථික ඇසුරුම්කරණය/ ඇසුරුම් අලෙවිකරණය/ඇසුරුම්කරණයේදී ඇතිවන පාරිසරික හා සෞඛ්‍ය බලපෑම/ඇසුරුම් සම්බන්ධ ප්‍රමිතිකරණය/හරිත ඇසුරුම්කරණය/තර්මෝ ප්ලාස්ටික් ක්‍රියාවලිය/නම්‍යශීලි අසුරුම්කරණය/දෘඩ ඇසුරුම්කරණය/ කඩදාසි, කොරුගේටඩ්, ෆයිබර් ඇසුරුම්කරණය/ ලී පෙට්ටි, වීදුරු සහ ලෝහ ඇසුරුම්කරණය හා ඇසුරුම්කරණය පිළිබඳ කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා ද ඇතුලත් වේ.

**ස්ථානය : කොළඹ අවට පහසු ස්ථානයක දී**

කාල සීමාව: 2022 ඔක්තෝම්බර් මස 15 දින සිට ( කර්මාන්ත නිරීක්ෂණ චාරිකාවන් 03 ද ඇතුලුව දින 15 ක් සෙනසුරාදා, ඉරිදා සහ පෝය දිනයන් හිදී.)

**පාඨමාලා ගාස්තු අනෙකුත් වියදම්:**

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලින් තෝරාගනු ලබන අයදුම්කරුවන් සඳහා සම්පූර්ණ පාඨමාලා වියදමෙන් 50% ක් කර්මාන්ත අමාත්‍යාංශය විසින් දරනු ලැබේ. ඉතිරි 50% ක වියදම කර්මාන්තය විසින් දරණ බවට එහි සේවායෝජක/ප්‍රධාන විධායක අධ්‍යක්ෂ අයදුම්පත්‍රයේ සහතික කල යුතුය. එක් සහභාගි වන්නකු සඳහා මුළු වියදම රු.75,120/= ක් වන අතර මෙම පාඨමාලාව සඳහා සහභාගිවන්නන්ගේ උපරිම සංඛ්‍යාව 25 කට සීමාවේ.

**අයදුම්පත් :**

අයදුම්පත් www.industry.gov.lk/applications වෙතින් බාගත කල හැක. ඉහත සඳහන් කළ සියලු විස්තර සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත් සේවා යෝජකයා ( සමාගමේ ප්‍රධානියා/ මානව සම්පත් අංශය ) හරහා **2022 ඔක්තෝම්බර් මස 05** වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි අධ්‍යක්ෂ, සංවර්ධන අංශ 1, කර්මාන්ත අමාත්‍යාංශය, නො.73/1, ගාලු පාර, කොළඹ 03. යන ලිපිනයට යොමු කළ යුතුය. වැඩි විස්තර සඳහා, දුරකථන අංක 011-2422319 අමතන්න. ෆැක්ස් 011-2432750
Email:sector1mid@yahoo.com
Web: www.industry.gov.lk

**ලේකම්**
**කර්මාන්ත අමාත්‍යාංශය**

QR for Web Link